

# ඩී.බී. ගේ සාහිත්‍ය සේවාව 3

ඩී.බී. කුරුප්පු මහතා ලියා පලකර ඇති කෙටිකතා පොත් සංඛ්‍යාව දහයකට ආසන්න වෙයි සිතමි. මේ අතර කෙටිකතා පරිවර්තන කිහිපයක්ද වෙයි. මේ ලිපියෙන් මා විමසුමට ලක් කරන්නේ ඩී.බී.ගේ 'විප්ලවය ආවොත් ' යන කෙටිකතා සංග්‍රහයෙනි. 'විප්ලවය ආවොත් 'පොතේ කෙටිකතා දහයකි. එම කෙටි කතා දහයෙන් වඳුරු දඩයම් කතාව හැර අනෙක් කතා නවයටම පාදක වන්නේ ශ්‍රී ලංකාවේ වෘත්තිය ජීවිතයේදී ඩී.බී. ලැබු අත්දැකිම්ය වඳුරු දඩයමට ළමා කාලයේ අත්දැකීමක් පාදක වී ඇත. නිවසේදී කොස් ගසකට පැමිණි වඳුරකුට වෙඩි තබා මරා දැමීම සිද්ධියට අදාලව කුඩා ළමයෙකුගේ අත්දැකිම් හෙළිකරන එම කතාව ළමා මනස් හොඳින් විවරණය කරන කෙටි කතාවක් ලෙස හැඳින්වීමට පුළුවන. එම කතාවට උපයෝගී කරගෙන ඇති කටබස් වහර කතා නාටකය වන බුම්මාගේ හැගිම් කිමට උචිතය.

අනෙකුත් කෙටිකතා බොහොමයක්ම සත්‍ය සිදුවීම ඒ ඇසුරෙන්ම ඉදිරිපත් කිරීමට ගත් ප්‍රයන්ත ලෙස හැඳින්වීම නිවැරදි යයි සිතමි. විප්ලවය ආවාත් කෙටිකතාවට වස්තු වන්නේ ශ්‍රී ලංකාවේ වෘත්තිය ජිවතයේදී හමුවු සම සමාජ පක්ෂයේ සගයකුගේ ජීවන පුවතයි. 'සුර සරදියෙල් ' කතාවට පාදක වී ඇත්තේ කතුවරයාගේ

> ලෝරා හත්සිලි නමැති ඉංග්‍රිසි ලේඛිකාව පුද්ගල වර්ධනය ගැන ලියූ පොතක් කියවීමේදි උපන් අදහසක් අනුව 'මගේ මළගම' කෙටිකතාව නිර්මාණය කළ බව කතුවරයා පවසයි.

හිතවතකු වු පද්මජීව, සරදියෙල් ගැන චිත්‍ර ඇඳ ප්‍රදර්ශණයක් පැවැත්වීමෙන් ඔහුට ලැබුණු ප්‍රසිද්ධිය ගෞරවය ඇතුලත් වන සත්‍ය සිදුවීම්ය. පොත් ගැහිල්ල ශ්‍රී ලංකාවේදී පොතක් මුද්‍රණය කිරීමේදී රජයට පක්ෂපාත අදහස් ඉදිරිපත් නොකරන පොත් මුද්‍රණය කිරිමට නිලධාරින් දක්වන අකමැත්ත හා රජයට ගැති බව උපහාසාත්මකව නිරූපණය කරන කතාවකි 'පොත් ගැහිල්ල' , 'විප්ලවය ආවොත් ' කෙටි කතා සංග්‍රහයේ දුර්වලම කෙටි කතාව විය හැකිය. ඩී.බී.ඔහුගේ චරිතාපදනය ලෙස සැලකිය හැකි අත්දැකීමට 'පායන හිරු ' පොතේ සඳහන් කර ඇත. (පි.361)

'දුරුනොවු අපලය' කතාවේ වස්තු බීජය අවුල් සහගත බවය. එය කියවාගෙන යාමේදී මට හැගිගියේ. එහි ආරම්භය හොඳ කෙටිකතාවක ආරම්භයක් ලෙස

## විප්ලවය ආවොත්

සිත් ඇදගනී. කතාව මැද දී කතාකරුවා තම සොහොයුරාගේ අස්ථියට වෙදකම් කළ සැටි වාර්තාගත ස්වරූපයකින් ඉදිරිපත් කිරීම නිසා පාඨකයා අතරමං වෙයි.

'ගැමි පුබුදුව' කෙටිකතාව ගමේ පිබිදීම සිදුවු සැටි අනුපිළිවෙලින් ඉදිරිපත් කිරීම නිසා වාර්තාගත ස්වරූපයක් ගනී. එහෙත් කතාව මැද දී සංවත්සර රැස්වීම පටන් ගත්තැන සිට අග දක්වාම කෙටි කතාවක ස්වරූපය ලැබී ඇත. එතැන් සිට කතාව පටන්ගත්තේ නම් මුල් කොටසේ වන සිදුවීම් වාර්තා ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

'කැත්තට පොල්ල' කෙටි කතාවක ස්වරූපය ගත් නිර්මාණයකි. දුම්රියේදී හමුවු දෙදෙනෙකුගේ කතාබහ තුළින් ඔවුනොවුන් හඳුනාගැනීම පිළිබඳ පුවතක් මේ කතාබහ පාදක වී ඇත.

'මගේ මලගම' , 'විප්ලවය ආවොත් ' පොතේ එන බොහොමයක් කතාවෙන් කතුවරයා අතින්ම භාෂනයක් වුවද හොඳ කෙටිකතාවක ස්වරූපය ලැබි ඇත. ලෝරා හත්සිලි නමැති ඉංග්‍රිසි ලේඛිකාව පුද්ගල වර්ධනය ගැන ලියු පොතක් කියවීමේදි උපන් අදහසක් අනුව 'මගේ මළගම' කෙටිකතාව නිර්මාණය කළ බව කතුවරයා පවසයි. (හැන්දෑව පි 34) තම කාමරය වසා ඇදෙහි වැතිරි දෑස් පියාගන්නා කතා නායකයා සිතින් මරු වැළඳ ගනි. ජිවිත කාලය තුළදී ඔහු ඇසුරුකළ හා පසුව මියගිය අය ජිවමානව ඔහුගේ මනස ඉදිරියේ දර්ශණය වෙයි. ඔවුන් කරන කියන දෙය තුළින් කතාව විකාශනය වෙයි. ඒ කියවන පාඨකයා තියුණු ආස්වාදයක් ලබනු නිසැකය.

'දරු පෙම' නමැති කෙටි කතාව පාදක වන්නේ මෙවන් පුවතකි. හොරෙන් පැන යන ජෝඩුව ගෙදරක රාත්‍රියේ නැවතීමට පැමිණ රත්රන් හා මැණික් පොදියක් ගෘහණියට බාරදෙන්නේ ආරක්ෂා සහිතව පසුදින දක්වා තබාගන්නා ලෙසය. එම රත්තරන් බඩු පොදියට ලෝභයෙන් ගෘහණිය විසින් ඔවුන් මරා වළ දැමීමක් එම අභිරහස පසුව පවුලේ එකම දියණිය විසින් දැනගැනීමත් ඒ තුළින් දෙමව්පියන් මුහුණ පාන අසීරු තත්වයක් මෙම කෙටි කතාවෙන් චිත්‍රනය වේ. බැලු බැල්මට අද්භූත කතාවක ස්වරූපයක් ඉසිලුවත් කතාව ඉදිරිපත් කර ඇති විලාශයෙන් ගෘහ නායිකාව වන ගීතා ගේ චරිතය නිරූපණය වී ආකාරයෙන් නිසි -දරු පෙම" සාර්ථක කෙටි කතාවක් ලෙස හැඳින්විය හැකිය.

"කාලීන ධම්ම සාකච්ඡා" යන කතාවද සාර්ථක කෙටි කතාවක් ලෙස හැඳින්වීමට පුළුවන. උගත් තරුණ භික්ෂුන් වහන්සේ නමක් පන්සලේදී ධර්ම සාකච්ඡා මාලාවක් ආරම්භ කරති. මේ සාකච්ඡාවේදී දෙබස් මාර්ගයෙන් බුදු සමයේ ප්‍රායෝගික පැත්ත දැඩි උපහාසයට ලක්වෙයි. ප්‍රායෝගික බුදු සමය සමඟ මුසුව ඇති මිත්‍යාමත හා අදහස් නිර්දය විවේචනය ලක්වෙයි.

# පැතිකඩ



ආචාර්ය පාලිත ගණේවත්ත

"විප්ලවය ආවොත් " හා "සුර සරදියෙල් " යන කෙටි කතා දෙකම කතුවරයාගේ වෘත්තිමය ජීවිතයේ සත්‍ය සිදුවීම ඒ අයුරින්ම දක්වා ඇත. ඇන්.ඇම්., පිලිප් ආදි නම්ගම් පවා දක්වා තිබිම නිසා එම කෙටිකතා වලට වාර්තාවල ස්වරූපයක් ලැබි ඇත. එම කෙටිකතා දෙකම ඩී.බී. ගේ - හැන්දෑවට පායන හිරු" පොත් පරිච්ඡේද දෙකක ස්වරූප ගනි. තමන් ඉදිරියේ ඇති සිදුවිම් රාශියකින් කෙටි කතාවකට උචිත සිදුවීම් තෝරාගෙන කෙටිකතාවක ආකෘතියට හා සන්දර්භයට උචිත අයුරින් සකස් කිරීමෙන් පමණි. හොඳ කෙටි කතාවක් නිර්මාණය කළ හැක්කේ 'විප්ලවය ආවොත් ' හා 'සුර සරදියෙල් ' යන කෙටිකතා දෙක තුළම කතුවරයාගේ අදහස් ඉස්මතු වීම නිසා ස්වයංභාෂණයක ස්වරූපය ගෙන ඇත. එය කෙටි කතාවක විකාශණයට අත්‍යවශ්‍ය අංගයක් වන චරිත නිරූපණයට ද බාධාවක් වෙයි.

මේ ලිපියෙන් මගේ විමසුමට ලක්වුයේ ඩී.බී.කුරුප්පු මහතා 2001 දී ලියා පළකල 'විප්ලවය ආවොත් ' කෙටිකතා සංග්‍රහය පමණි. ඩී.බි ගේ අනෙකුත් කෙටිකතා පොත් පිළිබඳව ඉදිරි ලිපිවලින් කතාබස් කිරිමට අදහස් කරමි.

දැන්වීමකි



# උත්තරීතර වූත් උතුම් වූත් ගෞරවණීය ඔබට

**ශාස්ත්‍රපති ගෞරවණීය**
**නාඔටුන්නේ විජිත ස්වාමීන් වහන්සේ**
**ජගත් ජේ එදිරිසිංහ සොයුරා**
**විජය කරුණාසේන සොයුරා**

ඉරිදා ලක්බිම පුවත්පතේ
සුන්දර නිහතමානී ද මෙල් සොයුරා
ඉරිදා ලංකාදීප පුවත්පතේ කර්තෘ
ආරියනන්ද දොඔගහවත්ත සොයුරා
ඉරිදා ලංකා පුවත් පතේ හිටපු ලේඛක
විරංජන හේරත් සොයුරා
ඉරිදා රිවිර පුවත්පතේ
තිස්ස රවීන්ද්‍ර පෙරේරා සොයුරා
ඉරිදා ලක්බිම පුවත්පතේ හිටපු ලේඛක
ශ්‍රීලාල් ප්‍රියන්ත සොයුරා

නිමල් ජයලත් සොයුරා
අසෝක සුබසිංහ සොයුරා
ශ්‍රීනාත් මද්දුමගේ සොයුරා
ශ්‍රියානි මද්දුමගේ සොයුරිය
සුනිල් පුෂ්පසිරි සොයුරා
මෙල්බන් ශ්‍රී ලංකා කොන්සල්
බන්දු දිසානායක මහතා
හිටපු තානාපති කුසුම්සිරි බාලපටබැඳි මහතා
සාමවිනිසුරු දයාසෝම බමුණුසිංහ සොයුරා
වරුණ සාවින්ද සොයුරා
රාජා ද අල්විස් සොයුරා
සමන් රංවල සොයුරා
ඩෙන්සිල් ජයවීර සොයුරා
දයා උඩවෙල සොයුරා
නිමල් අබේසේකර සොයුරා
කැන්බරා මුණසිංහ සොයුරා
ලක්ෂ්මන් කොඩිතුවක්කු සොයුරා
වි ක ධර්මබන්ධු මහතා

**ඔස්ට්‍රේලියාවේ මගේ දිවි ගමන් මගේ මා සමග ආදරයෙන් එක්ව සිටින මගේ බිරිඳ ශ්‍රියා ගලප්පත්ති සහ දරුවන් හතරදෙනා ද ඔබ සැම ද මට මහ මෙරකි. මෙහි නම් ලියවුණ සහ නොලියවුණ ගෞරවණීය ඔබ සැමගේ උත්තරීතර වූත් උතුම් වූත් සහෝදරත්වය, සෙනෙහස, මගේ ජීවිත කාලය පුරාවට පහනක් මෙන් දැල්වේවා..**

# සාලිය ගලප්පත්ති